**බියගම ප්‍රාදේශීය සභාව - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බියගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද 2.5 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත්, ඉකුත් වර්ෂයන් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු සහ ගෙවා තිබුණු විගණන ගාස්තු වටිනාකම් පිළිවෙලින් රු.295,398,089 ක් සහ රු.546,981ක් ආදායම් සහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විගණන ගාස්තුව නිශ්චිතව තීරණය කළ නොහැකි අතර, මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා එම ආයතනවල මැදිහත්වීම අවශ්‍ය වන බව. | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයට අදාල ප්‍රතිපූර්ණය නොවූ සේවක වැටුප් රු.15,036,101 ක්, සේවක වැටුප් ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබුණි. | මින් ඉදිරියට සිදු නොවීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | 2008 සහ 2012 වර්ෂවල තක්සේරු පදනම් කරගෙන වරිපනම් අයකර ගෙන තිබුණි. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව. | නැවත සිහි කැඳවීම් කර, නව රේට අනුව වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | එකතු වටිනාකම රු.1,443,559 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 83(ii) | සේවක ණය අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | නියෝගය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.201,645,061 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.188,532,345 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 78,937,332 | 81,142,124 | 85,082,494 | 68,915,184 | 78,530,710 | 78,878,277 | 72,893,953 | 72,855,554 |
| (ii) | කුලී | 8,188,546 | 7,023,996 | 6,381,916 | 11,653,229 | 7,679,130 | 7,184,542 | 6,374,447 | 11,218,577 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,145,000 | 6,313,725 | 51,717,824 | | 6,318,000 | 5,778,977 | 5,778,977 | |
| (iv) | වෙනත් ආදායම් | 36,191,100 | | 48,616,222 | | 29,683,100 | | 42,557,869 | |
| | | 129,461,978 | 94,479,845 | 191,798,456 | 80,568,413 | 122,210,940 | 91,841,796 | 127,605,246 | 84,074,131 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | 2023 ජනවාරි 01 දිනට රු.72,855,555 ක් වූ හිඟ හිටි වරිපනම් ශේෂයෙන් වර්ෂය තුල අයකිරීම් රු.21,691,292 ක් වූයෙන්, අයකළ ප්‍රතිශතය සියයට 30 ක් වී තිබුණි. | හිඟ ආදායම් අය කිරීම ක්‍රියාත්මක කරමින් පවතින බව. | හිඟහිටි වරිපනම් ආදායම් අයකළ යුතුය. |
| (ii) | හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ට වැඩි ඒකක 05 ක හිඟ ශේෂය රු.1,730,501 ක් අයකර ගෙන නොතිබුණි. | දේපල තහනම්කර අය කරනු ලබන බව. | හිඟහිටි වරිපනම් ආදායම් අයකළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂයෙන් රු.17,500,243 ක් වූ සියයට 25 ක් වසර 5 ක සිට වසර 10 ක් අතර ද, රු.16,586,007 ක් වූ සියයට 24 ක් වසර 3 ක සිට වසර 5 ක් අතර ද, රු.14,528,152 ක් වූ සියයට 21 ක් වසර 10 ට වැඩි ද, රු.11,716,944 ක් වූ සියයට 17 ක් වසර 1 ක සිට වසර 3 ක් අතර ද, රු.8,583,838 ක් වූ සියයට 12 ක් වසර 1 ට අඩු ශේෂයක් ද වී තිබුණි. | සැලසුම් අනුව අය කරමින් පවතින බව. | හිඟහිටි වරිපනම් ආදායම් අයකළ යුතුය. |
| (ආ) | කුලී | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂයෙන් සියයට 89 ක් වූ රු.8,904,453 ක් වසර 5 ත් 10 ත් අතරද, සියයට 10 ක් වූ රු.1,023,480 ක් වසර 3 ත් 5 ත් අතරද වී තිබුණි. | අධිකරණ තීන්දුව මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා අතර, හිඟ අය කරමින් පවතින බව. | හිඟ වෙළඳ ස්ථාන කුලී ආදායම් අය කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ හිටි බදු කුලී ශේෂයෙන් වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.1,053,157 ක්ද, වසර 3ත් 5 ත් අතර ශේෂය රු.428,070 ක්ද වී තිබුණි. | සැලැස්මට අනුව කටයුතු කරනු ලබන බව. | හිඟ බදු කුලී ආදායම අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2023 ජනවාරි 01 දිනට වූ හිඟ බදු කුලී ශේෂය රු.1,671,055 කින් අය කළ වටිනාකම රු.124,625 ක් වීමෙන් අය කළ ප්‍රතිශතයෙන් සියයට 07 ක් වී තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | හිඟ බදු කුලී ආදායම් අයකළ යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ උසාවි දඩ සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 2 ක 2021 සහ 2022 වර්ෂ සඳහා මුද්දර ගාස්තු උපලේඛන සකස්කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි. | උප ලේඛන සකස් කිරීමට නොහැකි වූ බව. | උපලේඛන සකස්කර උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ලද මහජන පැමිණිලි 345 කින් 213 ක් පමණක් විසඳා තිබුණි. | පිළිගන්නා බව. | මහජන පැමිණිලි විසඳිය යුතුය. |

### 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයහිමි ශේෂය තුළ වසර 2 ට වැඩි රු.17,000,000 ක්ද, වසර 1 ත් 2 ත් අතර රු.35,576,155 ක්ද වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | ඉතිරි මුදල ප්‍රතිපූර්ණය වීමට නියමිතව ඇති බව. | ණයහිමි ශේෂය නිරවුල් කළ යුතුය. |
| (ආ) | 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තැන්පත් කරන ලද, ගෙවල් කුලී තැන්පතු 792 ක වටිනාකම රු.804,347 ක් ගෙවල් කුලී හිමියන් වෙත ගෙවා නොතිබුණි. | ගෙවල් හිමිකරුවන් දැනුවත්කර නිරවුල් කරන බව. | ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ණයහිමියන් සහ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර තිබුණු අයිතම 14 ක වටිනාකම රු.53,199,658 ක් නිම කර, ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | මුදල ප්‍රතිපූරණය වන තෙක් ගෙවීම් කළ නොහැකිව පවතින බව. | කාර්යය සම්පූර්ණ කර ගෙවීම් කළ යුතුය. |
| (ඈ) | එකතුකළ අගය මත බදු ගිණුමේ ශේෂය රු.2,425,043 ක් වසර ගණනාවක සිට නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | නිරවුල් කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 02 දින රු.1,025,000 කට ගලි බවුසරයක් මිලදීගෙන තිබුණද, 2020 වර්ෂයෙන් පසුව ගලි බවුසර් සේවාව පවත්වාගෙන ගොස් නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුල යොදා ගැනීම ඵලදායී නොවන බැවින් මාර්ග නඩත්තු සඳහා යොදවා ගැනීමට නියමිතව ඇති බව. | නිෂ්කාර්ය වියදම වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතුය. |
| (ආ) | මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ලද තක්සේරු වටිනාකම රු.295,000 ක් වූ ට්‍රැක්ටරය අක්‍රිය වීම නිසා 2017 වර්ෂයේ සිට කසළ අංගනයේ අත්හැර දමා තිබුණි. | නඩත්තු කටයුතු සඳහා යොමු කර ඇති බව. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.2,739,000 ක් වූ නාන ළිං 6 ක් වැසී ගොස් ඇති බවත්, වටිනාකම රු.3,642,000 ක්වූ නාන ළිං 24 ක් භාවිතයේ නොතිබූ බවත් නිරීක්ෂණය විය. | අවස්ථානුකූලව භාවිතයට ගන්නා බව | අවශ්‍යතාවය හඳුනාගෙන භාවිතයට ගැනීමට සහ ගිණුම්ගත වටිනාකම නැවත සංශෝධනයට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.127,400,000 ක් වූ සභාව සතු ඉඩම් කැබලි 27 ක මායිම් සකස් කර, නාම පුවරු සවි කර නොතිබුණි. | මායිම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | මායිම් සකස් කර නාමපුවරු සවි කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු. 479,000 ක් වූ නාන ළිං 4 ක් සොයාගත නොහැකිවී තිබුණි. | ළිං හඳුනා ගත නොහැකි අතර, ප්‍රත්‍යාගණන කමිටුව වෙත යොමු කරන බව. | ගිණුම්ගත කර ඇති වත්කම් භෞතිකව හඳුනාගත යුතුය. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයෙන් 1995 වර්ෂයේදී ලැබී තිබූ රු.500,000 ක් වටිනා ට්‍රැක්ටරය සභාවට පවරාගෙන නොතිබුණි. | කටයුතු ආරම්භ කර ඇති බව. | භාවිතා කරන වාහන සභාවට පවරාගත යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය, මියගිය නිළධාරීන් 9 දෙනෙකුගේ ණය හා අත්තිකාරම් ශේෂය රු.1,229,662 ක් අය කරගෙන නොතිබුණි. | ණය මුදල් ගෙවන ලෙස දන්වා යැවීම සහ මරණ පාරිතෝෂිකය සකස් කර යොමුකිරීම සිදුකර ඇති බව. | හිඟ සේවක ණය ශේෂ අය කළ යුතුය. |